**ශීර්ෂය 309- ගොඩනැගිලි දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 309 - ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ඔක්තෝබර් 17 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

---

## 21. විසර්ජන ගිණුම

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 345.30 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 338.96 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 6.34 ක් හෙවත් සියයට 1.84 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | දිනට 31 දෙසැම්බර් 2014 | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 292.90 | 286.73 | 6.17 | 2.11 |
| මූලධන | 52.40 | 52.23 | 0.17 | 0.32 |
| **එකතුව** | **345.30** | **338.96** | **6.34** | **1.84** |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 30901 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 20.87 | 13.40 | 11.87 | 14.73 | 75.00 | 44.07 |

**2.3 අග්‍රිම ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7000/0000/00/0067/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 2.22 ක් විය.

**2.4 පොදු තැන්පත් ගිණුම්**

දෙපාර්තමේන්තුව යටතේ වන තැන්පත් ගිණුම් 03 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු. මිලියන 845.93 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0016/0033/000 | 112.81 |
| 6000/0000/00/0013/0052/000 | 732.37 |
| 6000/0000/00/0002/0012/000 | 0.75 |
| **එකතුව** | **845.93** |

**2.5 විගණන නිරීක්ෂණය**

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.

## 3.2 අයවැය විචලනය

වැය විෂයයන් 05 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 21 ක සිට සියයට 78 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

## 3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

විෂය අංක 30901 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී වර්ෂ 1 කට වැඩි හා වර්ෂ 2 කට වැඩි කාලයක සිට පැවැත එන එකතුව රු.335,530 ක හිඟහිටි ණය ශේෂ දෙකක් 2015 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

## 3.4 පොදු තැන්පත් ගිණුම

වර්ෂ 2 ක් ඉක්මවූ රු.මිලියන 50.86 ක් වූ තැන්පතු 03 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3.5 කාර්යසාධනය

2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂයේදී නිම කිරීමට අපේක්ෂාවෙන් සැලැස්මට ඇතුළත් කර තිබූ ව්‍යාපෘති අතරින් පහත සඳහන් ව්‍යාපෘතිවල කිසිදු කාර්යසාධනයක් සිදු කර නොතිබුණි.

| ව්‍යාපෘති වර්ගය | ඇස්තමේන්තුගත වියදම රු. මිලියන | ක්‍රියාත්මක නොවූ ව්‍යාපෘති සංඛ්‍යාව | ක්‍රියාත්මක නොවූ ව්‍යාපෘති සංඛ්‍යාව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති ගණනේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| Turnkey | 85.36 | 13 | 25.4 |
| Consultancy | 83.44 | 18 | 23.6 |
| Project Management | 209.9 | 05 | 20.4 |

## 3.6 අවිධිමත් ගනුදෙනු

--------------------

2014 ඔක්තෝබර් 21 දිනැති අංක PRE/2014/TR-01 දරන මැතිවරණ කොමසාරිස්ගේ චක්‍රලේඛය ප්‍රකාරව මැතිවරණ රාජකාරි සඳහා මුදා නොහළ සංචිත වාහනයක් දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකුට මැතිවරණ රාජකාරි සඳහා රැගෙන යාමට ලබා දී තිබුණි. 2015 ජනවාරි 07 දින සිදුවූ අනතුරකින් පසු අළුත්වැඩියා කිරිම සඳහා රු.112,992 ක් දෙපාර්තමේන්තුව විසින් වැය කර තිබුණි. එම වාහනය මැතිවරණ රාජකාරි සඳහා යොදවාගත් නිලධාරියා ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරේ රාජකාරි ආවරණය කළ නිලධාරියෙකු වූ අතර, උක්ත කාලපරිච්ඡේදය සඳහා එම නිලධාරියා ප්‍රවාහන හා ඉන්ධන දීමනා ද ලබා ගෙන තිබුණි. එවැනි දීමනා ලබන නිලධාරියෙකුට සංචිත වාහන පාවිච්චි කිරීමේ හැකියාවක් නොමැති වුවත්, උක්ත අලාභය අදාළ නිලධාරියාගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.7 පාඩු හා හානි

---------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(ආ) 2014 ජුලි 19 දින දෙපාර්තමේන්තුවට අයත් වාහනයකට සිදු වී තිබුණු අලාභහානිය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු නොකර රු.247,000 ක අලාභය පොත්වලින් කපා හැරිමට දෙපාර්තමේන්තු ප්‍රධානියා නිර්දේශ කර තිබුණි.

(ඇ) 2014 වර්ෂයේදී දෙපාර්තමේන්තුව සතු වාහන 02 ක් අපහරණය කිරීමේදී නිලධාරින් නිසි සැලකිල්ලෙන් කටයුතු නොකිරීම නිසා දෙපාර්තමේන්තුවට රු.322,050 ක අලාභයක් සිදුවී තිබුණි.

## 3.8 මානව සම්පත් කළමනාකරණය

--------------------------------

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

-----------------------------------------------

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 116 | 66 | 50 | - |
| (ii) | තෘතියික මට්ටම | 23 | 05 | 18 | - |
| (iii) | ද්විතියික මට්ටම | 281 | 179 | 102 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 178 | 123 | 45 | - |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 23 | - | 23 |
| | **එකතුව** | **598** | **421** | **193** | **23** |